# “ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයෙහි තොරතුරු තාක්ෂණික ජාලය” හෙවත්

# “LANKA COOP NET”

## නිර්මාණය සඳහා ආයතන ලියාපදිංචි කිරීම

“ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයෙහි තොරතුරු තාක්ෂණික ජාලය” හෙවත් “LANKA COOP NET” නිර්මාණය කර පවත්වාගෙන යාමට ආරම්භ කර ඇත.

මෙම තොරතුරු තාක්ෂණික ජාලය පහත කොටස්වලින් සමන්විත වේ.

- ✓ ශ්‍රී ලංකාවේ සියළුම සමුපකාරික ආයතනවල දත්ත රැස් කිරීම,ගබඩා කිරීම හා විශ්ලේශණය කිරීම සඳහා වූ මෘදුකාංගය
- ✓ “Coop City” සමුපකාර සුපිරි වෙළඳසැල්වල එදිනෙදා වෙළදාම හා ගබඩාකරණය සඳහා වූ මධ්‍ය පාලිත මෘදුකාංගය
- ✓ ඉහත මෘදුකාංග ආශ්‍රයෙන් පෙරාගත් තොරතුරු හා අනෙකුත් තොරතුරු මහජනතාවට මුදාහැරිය හැකි “LANKA COOP NET” වෙබ් අඩවිය.
- ✓ ඉහත වැඩසටහන් සඳහා අවශ්‍ය වන යටිතල තාක්ෂණික පද්ධතිය

මෙම කොටස්වලින් සමන්විත ජාලය නිර්මාණය, නඩත්තුව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සේවාදායක ආයතන ලියාපදිංචිකිරීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අරමුණු කරගෙන ඇත.

මෙසේ ලියාපදිංචිකරගත් ආයතන දැනුවත් කිරීමකින් පසුව ජාලය පිළිබඳ යෝජනා ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

මේ සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂිත ආයතන ඉහත මෘදුකාංග නිර්මාණයට , අවශ්‍ය වන යටිතල තාක්ෂණික පද්ධතිය සැපයීමට හා නඩත්තුව පිළිබද මනා හැකියාවක් හා පළපුරුද්දක් සහිත පිළිගත් ආයතන විය යුතුය.

www.trade.gov.lk වෙබ් අඩවියෙන් හෝ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත් ආකෘතිපත්‍රය සම්පූර්ණ කර පහත ලිපිනය වෙත ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කල හැක. ආකෘතිපත්‍ර අඩංගු කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි “LANKA COOP NET නිර්මාණය සඳහා ආයතන ලියාපදිංචිය” ලෙස සඳහන් කල යුතුය.

ආයතන ලියාපදිංචි කිරීම 2009 මාර්තු 16 දින ප.ව.3.00න් අවසන් වන බව දන්වනු කැමැත්තෙමි.

ඒ.පී.ජී.කිත්සිරි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
5වන මහල ,සතොස මහලේකම් ගොඩනැගිල්ල,
නො 27,වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
දුරකථන : 011 2478373 සිට 76 දක්වා